# සිංහල සඟරා ඉතිහාසය

දෙහිකුඹුරේ පඤ්ඤාසිරි හිමි
5 වන වසර

ශ්‍රී ලංකාවේ පුවත්පත් සඟරා පළ කිරීමට පටන්ගෙන දැනට අවුරුදු 150 කට අධික කාලයක් ගතවී ඇත්තේය. එබඳු දීර්ඝ ඉතිහාසයක් ඇති මේ ව්‍යාපාරය සම්බන්ධයෙන් නිවැරදි සම්පූර්ණ විස්තරයක් ලුහුඬු ලිපියකින් කියා පෑමද දුෂ්කර වැඩකි. පුවත්පත් සඟරා පළකිරීමට එංගලන්තයේ මෙන් රජයෙන් පීඩාවක් මෙරට නොවූ නමුත් මුල් අවධියේදී සඟරා පළකිරීමට ලොකුම බාධකය වූයේ ආර්ථික දුර්වලකම් හා මුද්‍රණ ශිල්පය හරිහැටි නොපැවතීමය. පුවත්පත සහ සඟරාව යන දෙකින් අප මේ ලිපිය සපයන්නේ මෙරට සඟරාවන්ගේ ඉතිහාසය හා තොරතුරු කීමට බැවින් පුවත්පත් ගැන කරුණු අත්හැර දැමීමට සිදුවන බව සැලකිය යුතුය.

ඉංග්‍රීසීන් යටතට මුහුදුබඩ පාලනය අත්වූ පසු ඔවුන් විසින් මුද්‍රිත වූ ප්‍රථම ප්‍රකාශනය "ගවර්න්මන්ට් ගැසට්යර්" නමින් 1802 මාර්තු මස 15 වෙනි දින නිකුත් විය. එතැන් සිට 1850 වන විට මෙරට ඉංග්‍රීසි බසින් පළ කළ පුවත්පත් හා සඟරා ගණන 19 කි. 1839 දී රාජකීය ආසියාතික සමිතියේ ශ්‍රී ලංකා ශාඛාව මගින් ඉංග්‍රීසියෙන් මුද්‍රිත රාජකීය "ආසියාතික සමිතියේ සඟරාව" තවමත් නොකඩවා මුද්‍රණය කරගෙන යනු ලැබේ.

### සිංහල සඟරා

ශ්‍රී ලංකාවේ පළමුවන සිංහල සඟරාව ප්‍රසිද්ධ කිරීමේ ගෞරවය හිමිවිය යුත්තේ කාටදැයි නිශ්චය වශයෙන් කිව නොහැක. ඊට හේතුව 1850 න් පසු සිංහල සඟරා කීපයක්ම එක එක ළඟදීම ප්‍රසිද්ධ කර ඇතත් ඒවායේ මුල් කලාප හෝ පිට කවර හෝ නැති වී යාම නිසා කර්තෘවරයාත්, නිකුත්කළ වර්ෂ, මාස ආදිය හරිහැටි දැන ගැනීමට මඟක් නැතිවීමය.

### ප්‍රථම සඟරාව

මෙරට පළමුවෙන්ම ප්‍රසිද්ධ කළ සිංහල සඟරාව "ලංකා නිධානය" බව අනුමානයෙන් කීමට පුළුවන. ඊළඟට දෙවන සඟරාව 1850 දී කොර්නේලිස් ද අල්විස් දේවගැතිතුමා විසින් "සිහල සඟරා" නමින් පළ කළ සඟරාවය. ඊට පසු කොළඹ ගුරු පුහුණු ආචාර්යව සිටි ජෝන් පෙරේරා මහතාගේ කර්තෘත්වයෙන් "ශාස්ත්‍රාලංකාරය" සඟරාව 1854 දී ද, නීතිඥ ජේම්ස් ද අල්විස් තුමා සහ පණ්ඩිත බටුවන්තුඩාවේ ගුරුතුමාගේ සම්බන්ධයෙන් "යතලබ" නම් සඟරාවක් 1855 දී අරඹන ලදහ. මේ ලෙස 1800 සිට 1945 වන විට වරින් වර පළවූ මෙරට සිංහල සඟරා ගණන 370 ක් පමණ වෙති. ප්‍රවෘත්ති පත්‍රත් සමග මේ සංඛ්‍යාව 500 ට අධික බව සඟරා ඉතිහාසයෙන් පෙනේ. මෙයින් සියයට 90 ක් පමණ ප්‍රසිද්ධ කළ වර්ෂ, මාසාදිය හා කර්තෘවරු කවරෙක්ද යන වග සොයා ගැනීමට හැකි වී ඇතත්, අනික්වායේ මුල් පිටපත් පවා දක්නට ලැබී නැති බව ප්‍රසිද්ධ කරුණකි. මුල් කාලයේදී සිංහල සඟරා කැපවූයේ වාද භේදවලටය. එනිසාම අවුරුද්දකින් දෙකකින් විනාශ වී ගොස් ඇත. එසේ වුව ද අද දක්වාම තත්ත්වය උසස් වෙමින් විද්‍යානුකූල වූ ද, ඓතිහාසික වූ ද ප්‍රයෝජනවත් ලිපි හා චිත්‍රවලින් ද සමන්විත සිංහල සඟරාව කලාවක් මෙන් දියුණු වී ගියේය.

### කවි සඟරා

බෙන්තොට ඇල්බට් ද සිල්වා මහතාගේ "කවිමිණි නිදන" ද, ඊට පසු 1907 "කවීන්ද්‍රයා" ද, වී. ඩී. ද ලැනරෝල් මහතාගේ "කවීන්ද්‍රයා" ද, කවි කලඹ, කවිකත් බරණ, 1927 දී ඇස්. මහින්ද හිමිගේ "කාව්‍ය මාලිනී", ජේ. වී. බී. අදිකාරම් මහතාගේ "සිංහල කවි කිරුළ", කවීශ්වරයා, කාව්‍ය ලෝකය, ජෝන් රාජදාස මහතාගේ "කවි මීවද", බැප්ටිස් රණවීර මහතාගේ "කිවියරද" කාව්‍ය රසය, කාව්‍ය ලෝකය, කාව්‍යාලංකාරය, සරසවි කවි සඟරාව යන මේවා සිංහල කවි කෝකිලයන්ගේ පැවති සඟරා වෙති.

### සිංහල සඟරා

සිංහලෙන් පළ වූ සඟරා අතර ධර්ම ශාස්ත්‍රීය ලිපි, ඓතිහාසික ලිපි හා වෙනත් සාරවත් ලිපි පළ වූ සඟරා ගැපියට ඇත්තේ අනලොස්සක් පමණකි. සත්‍ය සමුච්චය, ඥානාදර්ශය, කවි කල්ප තරුව, විදුලිය, සත්‍යාර්ථ සංග්‍රහය, සිළුමිණ (සඟරාව), ශ්‍රී ලංකා ශ්‍රී, කාලෝචිත සංග්‍රහය, සිරිසර සඟරා, ශ්‍රී ධර්ම ශ්‍රී, ඉතිහාස කථා, ධර්ම ද්වජය, ධර්ම රශ්මි, මහා බෝධි සඟරා, සත්බස, සිද්ධාන්ත දර්ශනය, සිතුමිණ, කල්‍යාණ මිත්‍රයා, සාහිත්‍ය තරඞ්ගනී, ප්‍රභාෂෝදය, විද්‍යෝදය, ග්‍රන්ථ ප්‍රකාශන, පහන, නුවණ, විද්‍යා දර්ශය, මහජන සඟරාව, අධ්‍යාපන සඟරාව, ගුරුකුල, සමාචාර, ලංකා මාතා, මගේ සඟරාව, සිංහල තරුණයා යන මේ සඟරා ශාස්ත්‍රීය වූ ද, දේශපාලනමය වූ ද, ජාතික නිදහස අරභයා වූ ද, පර්යේෂණාත්මක වූ ද, කලා ශාස්ත්‍රීය වූ ද උගතුන්ගේ ලිපිවලින් සරසා පළ කරන ලද නමුත් කිසියම් අභිරහස් හේතුවක් නිසාදෝ අකාලයේ අභාවයට ගිය බව පෙනේ.

### ක්‍රිස්තියානි සඟරා

ගත වූ අවුරුදු 150 ඇතුළත රට, ජාතිය, ආගම, භාෂාව හා සාහිත්‍යය වෙනුවෙන් ද සඟරා සමූහයක් ලියවී

ඇති බව පෙනේ. 1850 දී "සිංහල සඟරාව" ද, ඉන්පසු "භක්ති ප්‍රබෝධනය", සත්‍යා ලෝකය, රුවන්මල්දම, පවුලේ මිත්‍රයා, ළමයින්ට පහන, ක්‍රිස්තියානි මිත්‍රයා, බැප්ටිස්ට් ප්‍රවෘත්ති, මැතෝදිස්ත ප්‍රවෘත්ති, සූර්යා-ලෝකය, සිතුයන, සදිටු විදුර, ඥානාලෝකය, සත්‍යාව-බෝධය ද වෙති.

### ඉංග්‍රීසි සඟරා

මෙහි පළ වූ ඉංග්‍රීසි සඟරා අතර "රාජකීය ආසියාතික සමිතියේ සඟරාව", ලංකා පුරාවෘත්ත හා සාහිත්‍ය සඟරාව, ලංකා පුරාවිද්‍යා සඟරාව, ලංකා ශාස්ත්‍රීය සංග්‍රහය, ලංකා සාහිත්‍ය සංග්‍රහය, ස්පෝලියාෂිලනිකා සඟරාව, ලංකා ජාතික විවේචක සඟරාව, වැප්‍රොබේනියන් සඟරාව, බුඩිස්ට් සඟරාව, ඕරියන්ටලිස්ට්, යුනිවර්සිටියේ විවේචක සඟරාව යනාදිය මෙහිලා සඳහන් කළ හැකිය.

### වෛද්‍ය හා ජ්‍යොතිෂ සඟරා

මෙරට ආයුර්වේද වෛද්‍යවරයන් විසින් ද ආයුර්-වේදයේ සහ සිය වෘත්තියේ දියුණුව පතා සඟරා කීපයක් ප්‍රසිද්ධ කර ඇත. වෛද්‍යාධාර සංග්‍රහව, ආයුර්වේද කල්ප ලතා, සමාචාර හා ආයුර්වේද විද්‍යාලීය වාර්ෂික සංග්‍රහය යනාදිය වෙති. 1895 දී "විද්‍යාදීපිකා" නමින් ජ්‍යොතිෂ සඟරාවක් ද පළකර තිබේ.

### කාන්තා සඟරා

කාන්තාවන්ගේ සමාජ ගුණධර්ම හා දැනුම දියුණු කර ගැනීම සඳහා සඟරා කීපයක් පළ වී තිබේ. මහ-නුවරින් "ශ්‍රී සුධර්ම" නම් සඟරාව ද, ක්‍රිස්තු කාන්තා සමිතියකින් "සිතුයන" සඟරාව ද, "වනිතාර්ථදායිනී" සඟරාව ද, ලංකාමාතා සඟරාව ද, සරසවිය ද, ශ්‍රී ලංකා කුලඟන 1, කුලඟන 11, කුලඟන සිරි යන මේ සඟරා ද පළ වී ඇති බව පෙනේ.

### කවට හා විනෝද සඟරා

මුලින්ම ඉංග්‍රීසියෙන් පළ කළ "මුනියන්ඩි" හා "අප්පුහාමි" නමැති කවට සඟරාව ද, කවට කතිකයා, කවට මිත්‍රයා, කවට අඟහ ද, කවට කුරුල්ලා ද, පත්‍ර වශයෙන් දනුමැති කවටයා, කවට මුත්තා නමින් ද පළ කර ඇත. දෙහි අච්චාරු ලටපට, අතිරස, අලුත් බැනා, ඒක මේක, කනෝ පහර, ගමරාළගේ තුවක්කුව, තිපල් කසාය, රටතොට, වටපිට, පුංචි නෝනා, පුංචි මහත්තයා, පුහුල් දෝසි, සිදේවි, මරු සන්නිය, වගතුග, සුරතලී, ඇත්ත යුත්ත, රිසැරය, තරුව, ගිනි පුපුර, දුවුහට, දුදන පහර, රහමඬල, සුළමුල, ලොකු සිඤ්ඤෝ, වාසනා-වන්තයා, සේසත යනාදිය විනෝද සඟරා ගනයට අයත් වේ.

### ළමා සඟරා

ළමයි වෙනුවෙන් පළ කළ සඟරා අතර ළමයින්ට පහන, ළමයින්ගේ මිත්‍රයා, ළමයින්ගේ සඟරාව, ළමා හඬ, සිංහල දරුවා I, සිංහල දරුවා II, සිංහල ළමයා I, II, සිංහල ළමා සඟරාව සියුදය, කුමාරෝදය, කුමරසිරි යනාදිය දක්නට ඇත.

### වෙළඳ සඟරා

වෙළඳ ව්‍යාපාර වෙනුවෙන් බිහි වූ සඟරා අතර වෙළඳ සඟරාව, වෙළඳ ආලෝකය, වෙළඳාම I, II, වෙළඳ පහන වෙළඳාම හා කර්මාන්තය ආදිය බිහි වූ ඒවාය.

### ගුරු සඟරා

සිංහල පාසැල්වල ගුරුවරුන්ගේ අයිතිවාසිකම් හා දැනුම දියුණු කර ගැනීම සඳහා බිහි වූ සඟරා අතර ගුරු-වරයා, ස්කෝල සඟරාව, ගුරු ශිෂ්‍ය සංග්‍රහය, පාඨශාලා සංග්‍රහය, සිද්ධාර්ථ පාඨශාලා සංග්‍රහය, සවදේශ ගුරුවරයා ගුරු වදන, ගුරුවරයා I, II යනාදිය වෙති.

මුල් වකවානුවල සඟරා වැඩි හරියක් ආරම්භ කළේ යම් යම් වාද විවාද කිරීමේ පරමාර්ථයෙනි. ශාස්ත්‍රීය වාද, නිකාය වාද, ආගම් වාද, කුලවාද යන සතර වර්ගයට අයත් වාද විවාද සඳහා ඇති වූ සඟරා මගින් වුව ද ඇති වූයේ රටට, ජාතියට, ආගමට, භාෂාවට හා සාහිත්‍යයට වටිනා සේවයකි. එහි ප්‍රතිඵලය වශයෙන් එන්ට එන්ටම පුවත්පත් සඟරාවල තත්ත්වය උසස්වීමත්, දක්ෂ ලේඛකයන් පහළවීමත් දක්නට ඇති අතර, පාඨක ලෝකයාගේ චරිත හැඩගැසීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආගම් වාද, කුල වාද, නිකාය වාදාදිය ක්‍රමයෙන් රටට එපා වී පිළිකුල් වී කාලයත් සමගම ඒ සඟරා ද අභාවයට ගිය බව සිතිය හැක.

### ආශ්‍රිත ග්‍රන්ථ


1. 1958 සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත "සාහිත්‍යය" ත්‍රෛමාසික සඟරාව - 3 වන කලාපය
2. [illegible]පාල මුනිදාස චරිතය
3. සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල මහතා